**විසර්ජන ශීර්ෂය -122- ජනමාධ්‍ය හා ප්‍රචෘත්ති අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය**

**යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

I කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

II කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

## 1 කොටස

### ජනමාධ්‍ය හා ප්‍රචෘත්ති අමාත්‍යාංශය සහ එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළබඳ සම්පිණ්ඩන වාර්තාව

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 210 | රජයේ ප්‍රචෘත්ති දෙපාර්තමේන්තුව |
| 211 | ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,395,400,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.2,082,637,377 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තවල ප්‍රතිපාදනයන්ගෙන් ශුද්ධ ඉතිරිවීම් රු.23,730,565 ත් රු.166,053,369 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12.94 ත් 10.51ත් අතර පරාසයක පැවැතිණ. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 122 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 352,870,000 | 280,700,000 | 345,066,813 | 165,524,498 | 7,803,187 | 115,175,502 |
| 210 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 158,990,000 | 24,350,000 | 144,860,283 | 14,749,152 | 14,129,717 | 9,600,848 |
| 211 | ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව | 1,421,740,000 | 156,750,000 | 1,357,880,919 | 54,555,712 | 63,859,081 | 102,194,288 |
| | එකතුව | 1,933,600,000 | 461,800,000 | 1,847,808,015 | 234,829,362 | 85,791,985 | 226,970,638 |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේදී ආදායම් සංකේත 01 ක් සඳහා රු.345,757,440 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර රු.308,218,041 ක අදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන් දීමේ නිලධාරි | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත | තථ්‍ය | අඩුවෙන් එකතු කිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | |
| ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති | 2003-2-5 | 345,757,440 | 308,218,041 | 37,539,399 | 11 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 122 | 12201 | 7,000,000 | 6,617,764 | 3,600,000 | 4,505,417 | 30,000,000 | 16,812,005 |
| 210 | 21001 | 8,000,000 | 5,186,330 | 5,200,000 | 6,368,862 | 45,000,000 | 26,908,229 |
| 211 | 21101 | 77,000,000 | 40,569,981 | 38,000,000 | 56,992,870 | 300,000,000 | 237,048,076 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### (අ) අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම්වල රු24,502,985 ක හර ශේෂ තිබුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31දිනට ශේෂය හර |
|---|---|
| | රු |
| ජනමාධ්‍ය හා ප්‍රචෘත්ති අමාත්‍යාංශය | 213,546 |
| රජයේ ප්‍රචෘත්ති දෙපාර්තමේන්තුව | 292 |
| ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව | 24,289,147 |
| එකතුව | 24,502,985 |

**(ආ) පොදු තැන්පත් ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.143,773,262 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **ගිණුම් අංකය** | **2012 දෙසම්බර් 31දිනට ශේෂය** |
|---|---|---|
| | | රු. |
| ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 6000/0000/00/0015/0035 | 72,186,938 |
| රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 6000/0000/00/0011/0580 | 9,264,399 |
| | 6000/0000/00/0015/0092 | 21,734,357 |
| ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0192 | 40,587,568 |
| | | 143,773,262 |

## II කොටස
## එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

### 1. විසර්ජන ශිර්ෂය 122 - ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 සැප්තැම්බර් 02 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම්

ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

(i) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.33,400,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 ත් සියයට 82 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ආ) පොදු තැන්පත් ගිණුම

(i) වර්ෂ 2 ක් ඉක්මවූ රු.230,622. ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2012 වර්ෂය සඳහා ආනයනික රූපවාහිනී වැඩසටහන් වෙනුවෙන් අයකරගත් මුළු බදු ආදායම රු.81,999,587 ක් වන අතර ඉන් රු.69,879,747 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආයෝජනය නොකොට පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

### (ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

හිඟ ණය ශේෂ

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව, 2012 දෙසැම්බර් 31 දිනට සේවය අතහැර යාම නිසා වර්ෂ 4 ක සිට අයවීම් හිඟහිට තිබුණු රු.62,588 ක ශේෂයක් හා වර්ෂ 5 ක් ඉක්මවූ රු.7,907 ක ශේෂයක් නිරීක්ෂණය විය. මින් රු 62,588 ක මුදල අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර ඉතිරි මුදල ඇපකරුවන් ගෙන් අයකර ගනිමින් පැවැතුණි..

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 වාර්ෂික ක්‍රියාකාර් සැලැස්ම

ඉහත 1.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට අමාත්‍යාංශය වාර්ෂික ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සංයුක්ත සැලැස්මක් නොමැතිව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාර් සැලැස්ම පිළියෙල කර 2013 මැයි 14 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2013 ජූලි 23 දින ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශයේ 2012 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රන්මිහිතැන්න ජාතික ටෙලිසිනමා උද්‍යානය මගින් 2012 චිත්‍රපට කර්මාන්තය සඳහා පහසුකම් ලබාගැනීම තුළින් උපයාගත් ආදායම හෝ, එය නඩත්තු කිරීමට වැය වූ වියදම එහි ප්‍රගතිය පිළිබඳව කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

(ආ)ආනයනය කර විකාශනය කරන ලද ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජමය වැඩසටහන් වෙනුවෙන් බදු අයකිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වුවත්, ඉන් ලැබූ බදු ආදායම, බදු අය කළ වැඩසටහන් ප්‍රමාණය, තහනම් කළ වැඩසටහන් ප්‍රමාණය ආදියෙහි ප්‍රගතිය, වාර්ෂික කාර්යසාධන වාර්තාවේ සඳහන් කර නොතිබුණි.

1.4.5 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2012 වර්ෂය සඳහා අමාත්‍යාංශ මට්ටමින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම් සමඟ ඒකාබද්ධව අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 12කින් ආයතන 08 ක් සඳහා අවස්ථා 02 ක් බැගින්ද, ආයතන 04 ක් සඳහා එක වතාවක් බැගින් ද පවත්වා තිබුණි.

**1.5 වත්කම් කළමනාකරණය**

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මු.රෙ.754 අනුව සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම අදාළ නියමයන් පරිදි බඩු වට්ටෝරු ලේඛණය තුලනය කිරීමක් සහ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකිරීමේදී සමීක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් විසින් අදාළ ලේඛණ පරීක්ෂා කිරීමක් සිදුකර පොත් අනුව ශේෂයන්ගේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමක් හෝ පවත්නා බඩු වට්ටෝරු ලේඛණ පොත පරීක්ෂා කළ බවට තහවුරු කිරීමක් අමාත්‍යාංශය සහ රූපවාහිනී අභ්‍යාස ආයතනය යන ආයතන දෙකේදීම සිදුකර නොතිබුණි.

(ii) රූපවාහිනී අභ්‍යාස ආයතනය 2011 වර්ෂයේ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීමේදී ශ්‍රී ලංකා පදනම යටතේ අංශ 19 ට අදාළව පැවති ස්ථාවර වත්කම් ලෙස ලේඛණගත කළ යුතුව පැවති වත්කම් වර්ග 451 ක් පවරා දීම සිදුකර තිබුණු අතර, ඒවා නිවැරදිව හඳුනාගෙන ලේඛණගත කර නොතිබුණි.

(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

1999 පෙබරවාරි 26 දිනැති අංක 2/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය අතර කාර්ය මණ්ඩලයට ලබාදී තිබූ ජංගම දුරකථන 23 ක් ආපසු භාර දී තිබූ අතර ඒවායින් 08 ක් වෙනත් අමාත්‍යාංශ හා ආයතන වෙත පවරා තිබූ අතර ඉන් 05 ක් භාරගත් බවට සනාථ කිරීමේ ලියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ලැබිය යුතු ශේෂ

2012 දෙසැම්බර් 31 දිනට රූපවාහිනී නාලිකා 03 ක් සඳහා වර්ෂ 03 ක් ඉක්මවූ රු.20,414,445 ක හිඟ බදු ආදායමක් අයවිය යුතුව තිබුණි. මෙම හිඟ බදු ආදායම වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු අධිභාරය රු 9,260,309 ක් විය.

මින් එක් නාලිකාවක හිඟ මුදල රු.2,850,000 ක් 2013 වර්ෂයේදී අයකරගෙන තිබුණත්, එයට අදාළ අධිභාරය රු.2,451,000 ක් 2013 නොවැම්බර් වන විටද අයකරගෙන නොතිබුණි.

## 1.6. අනුකූල නොවීම්

### නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| <u>ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ</u><br>2010 මැයි 14 දිනැති අංක සීඑ/1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 3:1 ඡේදය | අමාත්‍යවරයාගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කළ හැකි උපරිම නිල වාහන 03 ක් වෙනුවට වාහන 07ක් ලබා දී තිබුණි |

## 1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

රන්මිහිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානය සහ ඒ අවට ඇති සංවර්ධනය පිළිබඳව වාර්තාමය වැඩසටහනක් සකස් කිරීම සඳහා 2012 අප්‍රේල් 19 දින බාහිර ආයතනයක් සමඟ රු.2,530,000 කට ඇතිකරගෙන තිබුණු අවබෝධතා ගිවිසුමට අනුව 2012 මැයි 10 දිනට පෙර DVD කොපි 1000 ක් අමාත්‍යාංශයට ලබා දිය යුතුව තිබුණි. ඒ වෙනුවෙන් 2012 අප්‍රේල් මස සියයට 20ක එනම් රු.506,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. කාර්ය ඉටුනොකිරීම මත 2013 ජනවාරි 17 දින එනම්, මාස 09කට පසු එම මුදල අයකර ගෙන තිබු අතර එම ව්‍යාපෘතිය 2013 අගෝස්තු 16 දින වන විටත් ඉටුකර නොතිබුණි.

## 1.8 කාර්යසාධනය

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා කියාකාර සැලසුම්වලට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

(i) රන්මිහිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානයේ රූගත කිරීම සඳහා සහභාගි වන අය සඳහා කාමර පහසුකම් සැපයීමට කාමර වර්ග තුනක් යටතේ කාමර 43 ක් ඉදිකර තිබුණු අතර ඒවායේ උපයෝජනය සියයට 3, සියයට 7, හා සියයට 13 ක් වශයෙන් ඉතා අඩුමට්ටමක පැවතුණි .

තවද චිත්‍රපට හා ටෙලිනාට්‍ය සඳහා චිත්‍රාගාරයක් ස්ථාපිත කර තිබුණද, 2012 වර්ෂය තුළදී එමගින් කිසඳු ආදායමක් උපයා නොතිබුණි.

(ii) ශ්‍රී ලාංකීය ගති සිරිත්වලට ගැලපෙන ගුණාත්මකභාවය ආරක්ෂා කරමින් චිත්‍රපට, ටෙලිනාට්‍ය විකාශය සඳහා 2006 අංක 11 දරන මුදල් පනතේ 6 (1) වගන්තියට අනුකූලව බදු නිදහස් කළ හැකි අතර, **2012 වර්ෂය තුළ විකාශය ව ආනයනික ටෙලිනාට්‍ය හා චිත්‍රපට 1462 ක් අතරින් 610 ක් එසේ බදු නිදහස් කර තිබුණි.**

(ආ) සැලසුම් කිරීම

වාර්ෂික ක්‍රියාකාර සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම.

රන්මිහිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානය සඳහා වෙනම පනතක් ස්ථාපිත කිරීමට 2012 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්ම යටතේ සැලසුම් කර තිබුණද, 2013 ජූලි මාසය වන විටත් පනතක් සම්මත කර නොතිබුණි.

**1.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

ගැලපුම් කළ යුතු ශේෂ

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය ව තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තර | කාල විශ්ලේෂණය | | එකතුව |
|---|---|---|---|
| | මාස 6ට වැඩි වර්ෂ 1ට අඩු | වර්ෂ 1ට වැඩි 3ට අඩු | |
| | රු. | රු. | රු. |
| (i) උපලබ්ධි නොවූ තැන්පතු | 160,977 | 34,625 | 195,602 |

| | | | |
|---|---|---|---|
| (ii) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 150,273 | - | 150,273 |
| (iii) හඳුනා නොගත් හර | 135 | 20 | 155 |
| (iv) හඳුනා නොගත් බැර | 4,217 | 12,809 | 17,026 |

1.10 **මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

අමාත්‍යාංශය විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2010 වර්ෂයේ සිට පෞද්ගලික නාලිකා ආරම්භ කිරීමේ බලපත්‍ර සඳහා ඉල්ලුම් කරන සියලු දෙනාටම අයදුම්පත් නිකුත් නොකරන බැවින් ස්වාධීනව පුද්ගලයෙකුට හෝ ආයතනයකට බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ අයිතිය සීමා වී තිබුණි. නමුත් රූපවාහිනී හා ගුවන් විදුලි සංස්ථා පනත්වල දැක්වෙන විධිවිධාන වලට අනුව එම සංස්ථාවන්හී ඒකහතාවය විමසීමෙන් තොරව අවස්ථා 8කදී බලපත්‍ර ලබා දී තිබුණි. ඊට අමතරව 2010 සැප්තැම්බර් 03 දිනැති අංක 1669/25 දරන ගැසට් නිවේදනයේ 4 ඡේදයට අනුව කේබල් රූපවාහිනී හෝ අන්තර්ජාලය මත පදනම් වූ රූපවාහිනී මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගෙන ඇති බවට තහවුරුවක් ලබා නොගෙන බලපත්‍ර 3ක් 2012 වර්ෂයේ දී නිකුත් කර තිබුණි.

(ආ) 2010 ඔක්තෝබර් 01 දින සිට බෞද්ධ උපදේශක සහා සම්බන්ධීකාරක තනතුරක් සඳහා හිමි නමක් පත්කර තිබූ අතර, පත්වීම කවදා තෙක්ද යන්න දක්වා නොතිබුණි. මෙම පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද වෙන්කර දී තිබූ කැබ් රථයක් සඳහා 2012 වර්ෂය වෙනුවෙන් ඉන්ධන සඳහා රු.167,160 ක් ද, අළුත්වැඩියා වියදම් සඳහා රු.758,073 ක් ද, අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි.

(ඇ) පෞද්ගලික සමාගමක් වෙතින් කුලී පදනම මත ලබාගත් ඩිපෙන්ඩර් ජීප් රථයෙහි ගිවිසුම් කාලය 2011 ජූනි 27 දිනෙන් අවසන් වී තිබුණද, 2011 ඔක්තෝබර් මස සිට 2012 දෙසැම්බර් මස දක්වා අළුත්වැඩියාවන් සඳහා රු.289,970 ක් වැය කර තිබුණි. මෙම මෝටර් රථය 2013 අගෝස්තු 17 දින වන විටද අමාත්‍යාංශය විසින් පරිහරණය කරමින් පැවතුණි.

(ඈ) 2011 වර්ෂය තුළදී හදිසි මිලදී ගැනීමක් සේ සළකා ටෙන්ඩර් මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව රු.30,154,000 ක් වටිනා පරිගණක 500 ක් මිලදී ගෙන තිබුණ අතර, 2013 අගෝස්තු මාසය වන විටත් නිසි පරිදි බෙදා නොදුන් පරිගණක 179 ක් ආයතනයේ ඉතිරිව පැවතුණි.

1.11 **අවිධිමත් ගනුදෙනු**

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

(අ) රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ 2010 මැයි 14 දිනැති අංක සීඑෆ/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛ ලිපියේ 5.3 ඡේදය අනුව ගරු අමාත්‍යවරයකුගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකගේ මාසික දුරකථන බිල්පත් ගෙවීම රාජකාරි නිවාස දුරකථනය හා ජංගම දුරකථනය වෙනුවෙන් රු.10,000 ක බැගින් එනම් වර්ෂයකට රු 240,000 කට සීමා විය යුතු වුවත්, එම සීමාවන් අභිබවා 2012 වර්ෂය තුළදී අමාත්‍යවරයාගේ නිල නිවාස දුරකථනය හා ජංගම දුරකථනය වෙනුවෙන් රු 616,755 ක් ගෙවා තිබුණි.

(ආ) 2012 වර්ෂය තුළදී අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය සංස්ථා 2 කින් සේවකයින් 17 දෙනෙකු අමාත්‍යාංශයට අනුයුක්ත කර අමාත්‍යවරයාගේ කාර්යයන් සඳහා යොදවා තිබූ අතර ඒ වෙනුවෙන් රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව රු.3,070,461 ක් ද ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව රු.3,743,720 ක්ද වැය කර තිබුණි. මෙම සේවකයන් ඉටුකළ කාර්යයන් හා සේවා කළ ස්ථාන සඳහන් නොවූ අතර ඔවුන්ගේ පැමිණීම සටහන් කිරීමද සිදු වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ගරු අමාත්‍යවරයාගේ විදුලි බිල වශයෙන් එකතුව රු.1,643,167 ක් ගෙවා තිබූ අතර, මාසික විදුලි බිල රු.76,162 සට රු.177,581 ක පරාසයක පැවතුණි.

1.12 **අනාර්ථික ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

රන්මිහිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානයේ ප්‍රධාන දොරටුවේ ආරක්ෂක කටයුතු, ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම, ආදී කාර්යයන් සඳහා නාවික හමුදාවේ නිලධාරීන් යොදවා සිටින අතර,එසේ සිටියදී ආරක්ෂක කටයුතු වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත 2012 වර්ෂය තුළදී රු.2,658,437 ක් ගෙවා ආරක්ෂක නිලධාරීන් 18 දෙනෙකු යොදවා තිබුණි. ටෙලි සිනමා ගම්මානයේ ආදායම් ඉක්මවා වියදම් වැඩිවීමට මෙවැනි නිෂ්කාර්ය වියදම් හේතු වී තිබුණි.

1.13 **කළමනාකරණ දුර්වලතා**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු ගත කරන ලද රන්මිහිතැන්න ප්‍රවේශපත්‍ර ආදායමෙහි නිවැරදිතාවය තහවුරු කිරීමට එයට භාරදුන් ටිකට් පත්‍රවල අනුක්‍රමික අංක හා විකුණු ටිකට් පත්වල අනුක්‍රමික අංක සමඟ ආදායම සසඳා බැලීමක් වගකිවයුතු නිලධාරියකු හෝ විෂය ලිපිකරු විසින් සිදු නොකරන අතර, නිකුත්කළ ටිකට්පත් හා ලැබූ ආදායම අතර රු. 99,305 ක ඌනතාවක් විය.

(ආ) 2011 සැප්තැම්බර් 15 දින අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දන්වා තිබුණ පරිදි බදු ආදායම රැස්කිරීමට අදාළ තොරතුරු අධීක්ෂණය කිරීම, බදු නොගෙවා ප්‍රචාරය කරන ලද වැඩසටහන් හෝ වෙළඳ දැන්වීම් පිළිබඳව සොයා බැලීමට හා ගෙවීම් පැහැර හැරීම් අවම කරගැනීම යන අරමුණු සහිතව බදු ආදායමින් රු.2,710,099 ක් වැයකර 2010 වර්ෂයේදී ස්වයංක්‍රීයව වැඩ කිරීමේ යන්ත්‍ර 02 ක් මිලදීගෙන තිබුණි. මෙම යන්ත්‍ර 2010 වර්ෂයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට පවරා තිබුණු අතර, එමගින් රූපවාහිනී වැඩසටහන් විකාශය කිරීම පරීක්ෂා කිරීම පමණක් සිදුකරන අතර, ඉල්ලුම් නොකරන නමුත් බදු අයවිය යුතු වෙළඳ දැන්වීම් විකාශය වේදැයි පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණි.

(ඇ) 1991 වර්ෂයේ සිට පෞද්ගලික ගුවන් විදුලි සහ රූපවාහිනී නාලිකා පවත්වා ගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී , තාවකාලික බලපත්‍ර ලෙස නිකුත්කර තිබූ අතර ස්ථිර බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අළුත් කිරීමේ ක්‍රමයක් සකස් කර නොතිබුණි. එබැවින් කිසිදු අධීක්ෂණයකින් තොරව නාලිකාවන්හි විකාශන කටයුතු දිගින් දිගටම සිදු කරනු ලැබේ. පසුව නිකුත් කර තිබූ තාවකාලික බලපත්‍රවල, පෙර සඳහන් නොවූ කොන්දේසිද ඇතුළත් කර තිබූ බැවින් ආයතන සම්බන්ධව ඒකාකාර ලෙස තීරණ ගැනීමේ ගැටළු මතුවී තිබුණි.

(ඈ) 2006 අංක 11 දරන මුදල් පනතේ 6 (1) වගන්තියෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලාංකීය ගති සිරිත් වර්ධනය කිරීමේ අදහසින් විදෙස් රටවල නිෂ්පාදනය කරන වැඩසටහන් මෙරට විකාශය කිරීම වෙනුවෙන් බද්දක් පනවා තිබුණි. එසේ වුවද, බලපත්‍ර 15 ක් යටතේ ක්‍රියාත්මක වන කේබල්, චන්ද්‍රිකා, අන්තර්ජාලය හා දුරකථන මත පදනම් වූ රූපවාහිනී නාලිකා මගින් විකාශය වන වැඩසටහන් මෙම බද්දට යටත් නොකිරීම නිසා අදාළ බද්ද පැනවීමේ පරමාර්ථයන් මෙරට තුළ ඉටු වී නොතිබුණි. තවද, මෙම රැස්කරගන්නා බදු ආදායම බැර කිරීම සඳහා අරමුදලක් පිහිටුවීමට 2009 වර්ෂයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමඟ එකඟ වී තිබූ අතර, එය 2013 ජූලි වන විටත් ඉටුකර නොතිබුණි.

(ඉ) රන්මිහිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානය අක්කර 235 ක භූමිභාගයක පවතින අතර, එහි වගා කටයුතු තුළින් ලද ආදායම එවා ඇති ආදායම් වාර්තා අනුව රු.41,062 ක් පමණි. කොපමණ ඉඩම් ප්‍රමාණයක වගා කටයුතු සිදුකරනවාද, ඒ සඳහා දැරූ වියදම, ආපන ශාලා වෙත ලබාදුන් ආහාර ද්‍රව්‍ය වල වටිනාකම , ප්‍රමාණයන් හා අලෙවි කිරීම පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය වෙත නොතිබීම හේතුවෙන් ඒ පිළිබඳ අධීක්ෂණයක් සිදු වී නොතිබුණි.

(ඊ) 2012 වර්ෂය තුළදී රන්මිහිතැන්න ජාතික ටෙලිසිනමා උද්‍යානයේ රූගත කිරීම්, කාමර පහසුකම් සැලසීම්, ප්‍රවේශපත් ආදායම සහ වෙනත් ආදායම්වල එකතුව රු.8,929,977 ක් වූ අතර, වර්ෂය තුළදී දරා තිබුණු වියදම රු.48,528,779 කි. චිත්‍රපට 01 ක් සහ ටෙලිනාට්‍ය 02 ක් පමණක් රූගත කිරීම හේතුවෙන් වර්ෂය තුළ රජයට රු.39,598,802 ක පාඩුවක් සිදුවී තිබූ අතර, මෙහි ආදායමද රාජ්‍ය ආදායමට බැරකිරීම වෙනුවට පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

(උ) ශ්‍රී ලංකා පදනමෙහි එක් අංශයක් ලෙස පැවති රූපවාහිනී අභ්‍යාස ආයතනය 2010 අප්‍රේල් 30 දිනැති අංක 1657/20 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතට පවරා ගනු ලැබුවද, 2013 වර්ෂය වන විටද මෙය විධිමත්ව සංස්ථාපනය කර නොතිබුණි. මේ සඳහා ප්‍රධාන විධායක තනතුරක් අනුමත කර තිබූ අතර,තාවකාලිකව අමාත්‍යාංශයේ නිලධාරීන් 06 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. 2012 වර්ෂයේ රු15,717,077 ක ආදායමක් උපයා තිබූ අතර අනුයුක්ත කරනු ලැබූ නිලධාරීන් හය දෙනාගේ වැටුප් නොසළකා රු19,427,399 ක අයහාර වියදමක් දරා රු. 3,710,322 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි. 2011 නොවැම්බර් සිට මේ දක්වා රු. 8,562,206 ක ප්‍රාග්ධන වියදමක් ද කර තිබුණි.

(ඌ) රූපවාහිනී අභ්‍යාස ආයතනය වෙනම ආයතනයක් ලෙස විධිමත්ව සංස්ථාපනය කර නොතිබියදී ඉන් ඉපයූ ආදායම රු.15,717,077 ක් හා අනුමැතියෙන් තොරව ඉන් වැයකළ රු.10,682,695 ක වියදම සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(එ) 2012 වර්ෂය තුළදී නිම කිරීමට යෝජිත ජනමාධ්‍ය ආචාර ධර්ම සංග්‍රහය 2013 ජූලි 30 දින වන විටත් නිම කර නොතිබුණි.

(ඒ) යහපත් මාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීමට හේතු වන සදාචාරාත්මක මාධ්‍ය භාවිතයක් වෙනුවෙන් වූ පනතක් හඳුන්වා දී ඒ සඳහා පවතින සියළුම විද්‍යුත් මාධ්‍ය නාලිකාවල කටයුතු නියාමනය කිරීම සඳහා ජාතික විකාශන අධිකාරිය පිහිටුවීමේ කටයුතු 2009 මැයි මස ආරම්භ කර තිබූ නමුත් 2013 ජූලි මස වන විටත් එය පිහිටුවා නොතිබුණි.

1.14 **මානව සම්පත් කළමනාකරණය**

(අ) **අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 14 | 00 | - |
| (ii) තෘතියික මට්ටම | 03 | 02 | 01 | - |
| (iii) ද්විතීයික මට්ටම | 97 | 86 | 11 | - |

| | | | | |
|---|---|---|---|---|
| (iv) ප්‍රාථමික මට්ටම | 33 | 32 | 01 | - |
| (v) වෙනත් (අනියම්/ තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | 00 | 01 | 00 | 01 |
| | ----- | ----- | ----- | ------ |
| එකතුව | 147 | 135 | 13 | 01 |
| | === | === | === | === |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 13 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 02. විසර්ජන ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූලි 31 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණනදීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි.

(ආ) ප්‍රතිපාදනය ඉක්මවා බැරකම්වලට එළඹීම

මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් සළසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹිය නොහැකි නමුත් වැය විෂයයන් 21ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා රු.3,143,831ක බැරකම් වලට එළඹ තිබුණි.

(ඇ) පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ රු.11,463,990 ක් වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

(i) ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශය අනුව 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 10 ඉක්මවූ මිය ගිය නිලධාරියෙකුගෙන් හා සේවය හැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ ණය ශේෂ එකතුව රු.261,272 ක් විය. මෙම ශේෂ අයකර ගැනීම පිළිබඳව පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ii) 2010 මැයි මස ස්ථාන මාරුවී ගිය නිලධාරියකුගේ රු.301,446 ක ණය ශේෂය 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු නොකර දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත නිලධාරීන්ගේ කේවල ශේෂ යටතේ ඇතුළත් කර තිබුණි.

(iii) ණය දීම සම්බන්ධයෙන් වූ විධිවිධානයන් ප්‍රකාරව පවත්වාගත යුතු සාමාජික ණය ලේඛණයෙහි වාරිකය පමණක් සටහන් කර තිබුණි.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

**(අ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැසම පිළියෙල කර නොතිබුණි.

**(ආ) වාර්ෂික කාර්ය සාධන වාර්තා**

2002 සැප්තැම්බර් 12 දිනැති හා 2004 පෙබරවාර් 20 දිනැති අංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වවත්, සමාලෝචිත වර්ෂයට අදල කාර්යසාධන වාර්තාව 2013 අගෝස්තු මාසයේදී පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

**(ඇ) අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් සිදුකර තිබුණු අතර, 2012 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන විමසුම් 07 ක් නිකුත් කර තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

පහත විග්‍රහ කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවැති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකොට සියයට 2.1 ක පොලී අනුපාතිකයක් මත 1999 දෙසැම්බර් 10 උන සැපයුම්කරු හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමග එළඹී ගිවිසුමට අනුව ප්‍රංශ රජයෙන් ලැබූ ණය ආධාර යටතේ ප්‍රංශ ප්‍රැන්ක් 9,150,000 (යූරෝ 1,442,601 ක් සමාන රු.මිලියන 102.2) කට 2003 වර්ෂයේදී මිලදී ගෙන ස්ථානගතකොට තිබුණු යන්ත්‍ර 2013 ජූලි වන විටත් නිෂ්ක්‍රීයව හා නිසි නඩත්තුවකින් තොරව පැවැතුණි.

(ii) ඉහත ණය මුදල කොටස් 04 ක් යටතේ ලබාගෙන තිබුණ අතර, ඒ සඳහා 2013 ජූලි 25 දින වන විට ණය මුදලින් ගෙවා ඇති වටිනාකම යූරෝ 404,590 ක් වන අතර, ඒ සඳහා ගෙවා

ඇති පොළිය යූරෝ 308,352 කි. ගවිසුමේ සඳහන් පොළී අනුපාතය සියයට 2.1 ක් වුවද, ඉන් බැහැරව 2000029 හා 2000061 යන ණය වර්ග 02 සඳහා සියයට 6.13 බැගින් 2013 ජූලි වන විටත් යූරෝ 172,295 ක් වැඩි අනුපාතයක් යටතේ ගෙවා තිබුණි. (විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව) මෙම ගැටළුව නිරාකරණය කරගැනීම සඳහා 2010 වර්ෂයේ ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබූ අතර, එහි නිර්දේශය වූයේ ප්‍රසිද්ධ ලංසු කැඳවීමක් මගින් අලෙවි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතු වුවත්, එසේ කටයුතුකර නොතිබුණි.

රජයට සිදුවූ අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන හඳුනාගැනීම සඳහා 2013 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iii) විකුණුම් ඉන්වොයිසි සැකසීම, පාරිභෝගිකයින්ට තොග හඳුනාගැනීමට පහසුකම් සැලසීම, තොග ලේඛණගත කිරීම පිළිබඳ පරිගණක මෘදුකාංගයක් රු.600,000 ක් ගෙවා 2008 වර්ෂයේදී මිලදීගෙන තිබූ නමුත්, විකුණුම් ඉන්වොයිසි සැකසීම හැර අනෙකුත් කාර්යයන් සඳහා මෙම පරිගණක මෘදුකාංගය 2013 ජූලි මස වන විටත් භාවිතා කර නොතිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව රජයේ ප්‍රකාශන කාර්යාංශයේ පවතින පොත් පිළිබඳ 2012 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ඇ) ලැබිය යුතු ශේෂ

බාහිර පාර්ශවයන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු ගිණුම් ශේෂවල වටිනාකම රු.3,255,876 ක් වූ අතර, එම මුදල අයකර ගැනීම පිළිබඳ තත්ත්වය අසතුටුදායක විය.

## 2.6 අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය ව නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |

(අ) මුදල් රෙගුලාසි

| | | |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 371(2) | 763,900 | තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දීම මාණ්ඩලික නිලධාරීන්ට පමණක් සීමාවිය යුතු වුවත්, අවස්ථාවන් 36 කදී එකතුව රු.763,900 ක අත්තිකාරම් මාණ්ඩලික නොවන නිලධාරීන්ට ලබා දී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(2)(ආ) | 93,400 | කාර්යය නිමවූ වහාම අතුරු අග්‍රිම පියවිය යුතු වුවත්, එකතුව රු 93,400 ක් වූ අවස්ථා 4කට ලබාදී තිබුණු අතුරු අග්‍රිම දින 43 ත් 98 ත් අතර කාල පමාවකට පසුව පියවා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 454 | | තොග පොත් තුලනය කර ශේෂය ඉදිරියට ගෙනවිත් නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 752 | | බඩුලේඛණ පොතෙහි සෑම සටහනක්ම බඩුලේඛණ වවුචරයකින් තහවුරු විය යුතු වුවත් ලැබුණ භාණ්ඩ සනාථ කර ගැනීම සඳහා කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 802(8) | | වාහන මිලයට ගත් දිනය, මිල, අළුත්වැඩියාවන්, නිෂ්කාර්යව පැවැති කාලය ආදී තොරතුරු ඇතුළත් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 1645 | | වාහන ලොග් පොත සම්පූර්ණ කර නොතිබුණි. |

## 2.7 කාර්යසාධනය

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා සංයුක්ත සැලැස්ම අනුව දෙපාර්තමේනතුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

ස
ැ
ලැ
ස
ම්
ක
ි
ම

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.4.2 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම පිළියෙල නොකිරීම හේතුවෙන් වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම හා කාර්යසාධන වාර්තාව සැසඳීම් කළ නොහැකි විය.

(අ) ක්‍රියාකාර සැලැස්මේ ක්‍රියාකාරකම් 25 ක් සඳහා රු.27,000,000 ක මූල්‍ය ප්‍රතිපාදන සළසා තිබූ නමුත්, ඉහත චක්‍රලේඛය අනුව කාර්යසාධනය ඇගයීමට ලක්කිරීමට හැකි ආකාරයෙන් නිම කිරීමට යෝජිත කාර්යයන් සංඛ්‍යාත්මකව දක්වා නොතිබුණි.

(ආ) රු.මිලියන 94 ක ප්‍රතිපාදනයෙන් රු. මිලයන 3.8 ක ප්‍රතිපාදනයට අදාල කාර්ය සැලැසුම් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක සවරූපයේ ඒවා විය. නියදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

කොළඹ කොටුව රජයේ ප්‍රකාශන අංශයේ ගබඩාව පවතින ගොඩනැගිල්ලෙහි ඇති බිම හල බාහිර පාර්ශවයකට බදු දී තිබුණ ද බදු මුදල් 2004 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවට අයවී නොතිබුණි .තවද විදුලි බිල්පත් හා වරිපනම් ගාස්තු වශයෙන් දෙපාර්තමේන්තුවට අයවියයුතු රු.898,780 ක මුදල ද 2013 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.9 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### 2.9.1 මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම

දෙපාර්තමේන්තුවේ නව මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.200,763,112 කට පුද්ගලික ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණු අතර ඒ වෙනුවෙන් රු.196,080,674 ක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 ජූනි 08 දිනැති අවසන් බිල්පත්‍රය ගෙවීමට පෙර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව වැඩ ඉටු කර ඇති බවට සහතිකයක් හා දෙපාර්තමේන්තුව දැනුම් දුන් හඳුනාගත් අඩුපාඩු නිවැරදි කිරීමෙන් පසුව ගොඩනැගිල්ල භාරගත් බවට උපදේශන සමාගම සහතිකයක් ලබාදී නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 මාර්ගෝපදේශය අනුව ආයතන ප්‍රධානියා විසින් ගොඩනැගිල්ල භාරගැනීමට පෙර ඉටුකර ඇති වැඩවල ගුණාත්මක භාවය ස්වාධීනව පරීක්ෂා කිරීමකින් තොරව අවසන් බිල්පතය ගෙවා තිබුණි.

(ආ) නව මාධ්‍ය මධ්‍යස්ථානයෙහි 700 $m^2$ ක පමණ වපසරියකින් යුතු ශ්‍රවණාගාරය ප්‍රමිතියෙන් තොරව ඉදිකර තිබුණි. උපදේශක සමාගම විසින් 2011 නොවැම්බර් 02 දින ගොඩනැගිල්ල භාරගෙන ගෙවීම් කර මාස 6 ක් ඉක්ම යාමට ප්‍රථම අනාවරණය වූ පහත අඩුපාඩු 2013 නොවැම්බර් 30 දින වන විටත් නිවැරදි කර නොතිබුණි.

(i) ශ්‍රවණාගාරයට විදුලිය සැපයීමේදී 3 core වයර් වෙනුවට අඩු ප්‍රමිතියේ වයර් යොදා තිබීම නිසා විදුලි පද්ධතිය විධිමත්ව හා අවශ්‍ය පරිදි භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

(ii) ශ්‍රවණාගාරයෙහි රු.11,000,000 ක් වැය කර ස්ථාපිත කර තිබූ වායුසමන පද්ධතිය, විදුලිය සහ ශබ්ද සපයන අංශ සඳහා ක්‍රියාත්මක නොවන අතර, එහි ඇති වටිනා උපකරණවල කල්පැවැත්ම කෙරෙහි එය බලපා තිබුණි.

(iii) ශ්‍රවණාගාරයේ වේදිකාව දෙපස ඉදිකර ඇති බැල්කනි 02 න් දකුණුපස බැල්කනියට ප්‍රවිෂ්ඨ වීම සඳහා පඩිපෙලක් නිර්මාණය කර නොතිබුණි.

(iv) 60$m^2$ ක පමණ වේදිකාව රු.402,858 ක් වැය කර ඉදිකර තිබුණත් අනුමත දැව භාවිතා නොකිරීම හෝ දැව ආරක්ෂක භාවිතා නොකිරීම නිසා කුඩා කෘමි විශේෂයක් සිදුරු කර තිබුණි. මේ හේතුවෙන් වේදිකාව අනාරක්ෂිත තත්ත්වයේ පැවැතුණි.

(v) ශබ්ද ආවරණය සඳහා බිත්ති නිමකිරීමේදී ප්‍රමිතියෙන් බැහැරව අවිධිමත්ව නිමකිරීම නිසා ශබ්දය ආවරණය නොවන බැවින් අවශ්‍ය අරමුණ ඉටුවී නොතිබුණි.

(vi) වේදිකාව දෙපස බිත්ති ප්‍රමිතියෙන් බැහැරව ඉදිකිරීම නිසා 75$m^2$ ට වැඩි ප්‍රමාණයක් වේයන් කෑමට ලක්ව තිබුණි.

(ඈ) නව ගොඩනැගිල්ලේ හදිසි පිටවීමේ දොරවල්වලට අදාලව කොළඹ මහ නගර සභාවෙන් සහ ප්‍රධාන ගිනි නිවීමේ නිලධාරියකුගේ වාර්තා ලබාගැනීමකින් තොරව හා නිසි ප්‍රමිතියකින් තොරව සකස් කර තිබූ ගිනි ආරක්ෂිත දොරවල් 04 ක් සඳහා උපදේශන ආයතනයේ නිර්දේශ මත රු.410,000 ගෙවා තිබුණි.

(ඇ) ඉදිකිරීමට අදාලව වැය කර තිබූ වියදම් පරීක්ෂාවේදී හා වැඩ බිමේ අදාල උපදේශක ආයතනයේ නිලධාරීන් සමඟ විගණන නිලධාරීන් සිදු කරන ලද නියැදි භෞතික පරීක්ෂණවලදී අනාවරණය වූ හා එකඟ ව පරිදි කොන්ත්‍රාත්කරුට රු.15,436,872 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ නව මාධ්‍ය මධ්‍යස්ථානය සඳහා 400v ක විදුලි බල අවශ්‍යතාවයකට ලංසු ඉදිරිපත් කර 600v ක ධාරිතාවයක් ස්ථාපනය කර තිබුණ අතර, ඒ සඳහා යොදා තිබූ කේබලය ප්‍රමාණ පත්‍රයේ සඳහන් නියමයන්ගෙන් බැහැරව පිරිද්දීම් (Joint) කර තිබුණි. තවද, ප්‍රමාණ පත්‍රයට අනුව විශේෂ ඇණවුමක් මගින් ලබාගෙන උපදේශන සමාගමේ නිර්දේශය මත සැපයිය යුතු බව සඳහන් කර තිබුණද, එම ඇණවුම හෝ මිලදී ගත් ඉන්වොයිසිය හෝ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, වෙළඳපලේ පවතින මිලට වඩා අසාමාන්‍ය ලෙස වැඩි මිලක් එනම්, රු.12,059,320 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(ඊ) නව මාධ්‍ය මධ්‍යස්ථානය රු.මිලියන 315.4 ක කොන්ත්‍රාත් වටිනාකමකින් යුක්තව ඉදිකිරීමේදී රු.15,436,872 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණ බව උපදේශනය සැපයූ ඉංජිනේරු සංසථාවේ නිලධාරීන් සමඟ කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඌ) මෙම ඉදිකිරීම සඳහා උප කොන්ත්‍රාත් ලේඛණය, වගකීම් සහතික (විදුලි උපකරණ, වායු සමීකරණ යන්ත්‍ර, ගිනි ආරක්ෂිත දොරවල්), තෝරාගත් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන ලද ලංසු ලියවිලි, සියලුම ලංසුකරුවන්ගේ ලංසු ලියවිලිවල විවෘත නොකළ පිටපත්, පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සම්බන්ධ ඇතිකරගත් ගිවිසුම, ආදී තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස එම ගනුදෙනු සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2.9.2 නව මාධ්‍ය මධ්‍යස්ථානයට ලී බඩු මිලදී ගැනීම
-----------------------------------------------

නව මාධ්‍ය මධ්‍යස්ථානයට ලී බඩු මිලදී ගැනීම සඳහා ආයතන 05 කින් මිල ගණන් ඉදිරිපත් වී තිබූ අතර, අවම මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුගේ ආයතනය තෝරාගෙන රු.22,860,841 කට ලී බඩු මිල දී ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සාම්පල් පරීක්ෂාව සිදුකරන ලද අයිතම 23 ක් අතුරින් භාණ්ඩ වර්ග 11 ක්ම එකඟ වූ මාදිලිවලින් බැහැරව සැපයුම්කරුගේ අභිමතය පරිදි සපයා තිබුණි. මෙම වෙනස්වීම් තිබියදීත් ලැබුණ භාණ්ඩ වගකිව යුතු නිලධාරියකුගේ පරීක්ෂාවකින් තොරව එනම්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 හා 8.12.2 මාර්ගෝපදේශවලට පටහැනිව හා රු.1,285,065 ක් ගෙවා උපදේශනය ලබාගත් සමාගමේ නිර්දේශයක් ද රහිතව ගෙවීම් කර තිබුණි.

(ආ) පෞද්ගලික ආයතනයකට 2011 නොවැම්බර් 30 හා 2011 දෙසැම්බර් 30 යන දිනයන් හිදී ලීබඩු මිලදී ගැනීම වෙනුවෙන් රු.21,006,300 ක් ගෙවා තිබූ අතර, ඉන් රු.2,083,800 ක් වටිනා භාණ්ඩ සම්බන්ධ අඩුපාඩු 2011 වර්ෂයේ කළමනාකරණ විගණන වාර්තාවෙන් ද පෙන්වා දී තිබුණි. පහත කරුණු සම්බන්ධයෙන් පත් කරන ලද දෙපාර්තමේන්තු කමිටුව විසින් උපදේශන සමාගමේ නිර්දේශ රහිතව ආසන 04 සෝෆා සඳහා රු.211,200 ක් ද, ප්‍රවේශ ශාලා පුටු සඳහා රු.826,000 ක් ද වශයෙන් රු.1,037,200 ක මුදලක් වැඩිපුර ගෙවීම් ලෙස ගණනය කර එම මුදල රඳවා ගැනීම්වලින් අඩුකර ගැනීමට කටයුතු කිරීම නිසා රඳවාගැනීම් තබාගැනීමේ පරමාර්ථය ඉටු වී නොතිබුණි.

(i) ලංසු කැඳවීමේදී ආසන 04 සෝෆා (Four seater sofa) 15 ක් එකක් රු.105,600 ක් බැගින් රු.1,584,000 කට සැපයීමට එකඟවී තිබුණ අතර, ඒ සඳහා ආසන 04 සෝෆා ( Four seater sofa) 08 ක් වෙනුවෙන් රු.844,800 ක් ගෙවා තිබුණි. නමුත් ආසන 04 සෝෆා ( Four seater

sofa) කිසිවක් සපයා නොතිබූ අතර, ඒ වෙනුවට ප්‍රමාණ පත්‍රයේ සඳහන් පිරිවිතරවලින් බැහැරව (ස්වභාවික ලෙදර් වෙනුවට කෘත්‍රිම ලෙදර් යොදා) ඉහත මිල ගණන් යටතේම ආසන 03 සෝෆා ( Three seater sofa) 08 ක් සපයා තිබුණි.

(ii) ආසන 04 ප්‍රවේශ ශාලා පුටු (Four seater lobby chair) 46 ක් 1ක් රු.29,500 බැගින් රු.1,357,000 කට සැපයීමට එකඟ වී තිබුණද, ප්‍රමාණ පත්‍රයේ හා පිරිවිතරවලින් බැහැරව ආසන 03 පුටු (Three seater) 09 ක් හා ආසන 02 පුටු ( two seater) 08 ක් පමණක් සපයා තිබුණි. ආසන ( Lobby seat) එකක් කොටස් වශයෙන් සළකා ආසන (seat) 42 කට ගෙවීම් කිරීම හේතුවෙන් රු.973,500 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද, විගණනය කරන අවස්ථාව වන විටත් මෙම පුටු මල බැදීමට ලක්ව තිබුණි. ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශයන්ට ප්‍රකාර රජයට වඩාත් වාසිදායක අයුරින් අරපිරිමැස්මෙන් හා ගුණත්වයෙන් යුක්ත මිලදී ගැනීම් සිදුකළ යුතු අතර, ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහයේ 4.4 මාර්ගෝපදේශය ප්‍රකාර කොන්ත්‍රාත් ගොනු කිරීම හා කොටස්වලට බෙදීම සිදුකළ හැකි වුවත්, එසේ සිදු නොකිරීම නිසා අයිතමයන් 35 ක් සඳහා රු.2,249,772 ක මූල්‍යමය වාසියක් රජයට ලබාගත හැකිව තිබුණද, මිල ගණන් සැසඳීම් කර එම වාසිය ලබා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි

(i) උපදේශන සමාගමේ සහාය ඇතිව කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි එකඟ වූ ප්‍රමිතීන්ගෙන් සහ පිරිවිතරවලින් බැහැරව අයිතම් 12 ක් සඳහා රු.3,522,700 ක් වැඩිපුර ගෙවීමක් ද එකඟ වූ පිරිවිතරවලින් බැහැරව රු.2,568,800 කට සැපයූ භාණ්ඩ වර්ග 03 ක් පාවිච්චි කළ නොහැකි තත්ත්වයෙන් පැවැතුණි.

(ඇ) ලී බඩු මිලදී ගෙන තිබුණු සමාගමේ ලංසුවට අදාළ මුල් පිටපත හෝ එහි අනු පිටපත විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.9.3 අනෙකුත් මිලදීගැනීම්
----------------------

(අ) පරිගණක යන්ත්‍ර 13 ක් හා යූ.පී.එස්.13 ක රු.1,312,220 කට මිලදී ගැනීම සඳහා 2012 මාර්තු 17 සදුකළ කොන්ත්‍රාත් ප්‍රදානයේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීම හා 8.9.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි. 2012 මැයි 23 දිනවන විටත් දෙපාර්තමේන්තුව වෙත එම පරිගණක හා උපාංග සපයා නොතිබුණු අතර ඉන් රු.928,628 ක්

වටිනා පරිගණක යන්ත්‍ර 09ක් හා යූපීඑස් 13ක ඇණවුම අවලංගු කර තිබීම නිසා, ඉන් දෙපාර්තමේන්තුවට සිදුවූ අලාභය අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සඳහා රු.1,116,000 ක් වටිනා කැමරා උපකරණ මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8, 7.9.1, 7.11.1 හා 8.9.1 මාර්ගෝපදේශයන්ට පටහැනිව කටයුතු කර තිබුණි. ප්‍රසම්පාදන කමිටුව විසින් වැඩි මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුගෙන් කැමරා උපකණ මිලදී ගැනීමට ලබාදුන් තීරණයට හේතු පැහැදිලි කර නොතිබුණි.

## 2.10 කළමනාකරණ දුර්වලතා

### පිළිතුරු නොළත විගණන විමසුම්

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 06 කට 2013 ජූලි 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලින් ගණනය කළ හැකි ගනුදෙනුවලට අදාළ වටිනාකම රු.534,260,873 ක් විය.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

(අ) <u>අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව</u>

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 06 | 06 | 01 |
| (ii) තෘතියික මට්ටම | 16 | 06 | 10 | - |
| (iii) ද්විතීයික මට්ටම | 225 | 189 | 41 | 05 |
| (iv) ප්‍රාථමික මට්ටම | 52 | 46 | 06 | - |
| (v) වෙනත් - අනියම් | - | 04 | - | 04 |
| - තාවකාලික | 20 | 14 | 06 | - |
| එකතුව | 324 | 265 | 69 | 10 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 69 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

පුරප්පාඩු 69 ක් පැවතියදීත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 08 දෙනෙකු වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවලට මුදා හැර තිබුණි. ඉන් නිලධාරීන් 06 දෙනෙකු සඳහා 2012 වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු.2,100,107 ක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි.

03. විසර්ජන ශීර්ෂය 211 - රජයේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව

3.1 විගණන විෂය පථය

රජයේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 02 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණ අදහස් දැක්වීම් හා සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

3.2 ගිණුම් හා සැසඳීම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 , 149, 150 හා 152 ව්‍යවස්ථාවන් , වෙනත් ව්‍යවස්ථාපිත

විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන් දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 3.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.13 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

දෙපාර්තමේන්තුව විසින් විෂය අංක 21101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2013 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් එය මාස.1 $^1/2$ ක ප්‍රමාදයකින් පසුව 2013 මැයි 16 දින ඉදිරිපත් කර තිබුණි.

### (ආ) පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ රු.370,453 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### (ඇ) ආදායම් ගිණුම

ඉදිරිපත් කළ ආදායම් ගිණුමට අනුව රු. 612,549,490 ක්වූ ආදායම් හිඟ හිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 1 සිට වර්ෂ 23ක් අතර කාල පරාසයකට අදාල විය. එම හිඟ හිටි ආදායම අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

### (ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

#### හිඟ හිටි ණය ශේෂ

විෂය අංක 21101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව වර්ෂ 2 කට වැඩි අයවීම් හිග හිට තිබුණු ශේෂවල එකතුව රු.6,259,450 ක් වූ අතර එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

3.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

3.4.1 සංයුක්ත සැලැස්ම

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 3 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

3.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වනවිටත් පිළියෙල කර නොතිබුණි.

**3.5** වත්කම් කළමනාකරණය

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත දක්වා ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| කොමොරි යන්ත්‍රය | 01 | වර්ෂ 05 |
| PO 33 යන්ත්‍රය | 01 | වර්ෂ 06 |
| Pollar Cutter යන්ත්‍රය | 01 | වර්ෂ 05 |

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2010 දෙසැම්බර් 17 දිනැති අංක පී/එෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2012 දෙසැම්බර් 31 දිනට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2013 දෙසැම්බර් 20 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසන් වරට භාණ්ඩ සමීක්ෂණය පවත්වා තිබුණේ 2011 වර්ෂය වෙනුවෙනි.

(ඇ) භෞතික පරීක්ෂාවන්

2012 අගෝස්තු 16 දින පිළියෙල කරනලද වාහන ලැයිස්තුව අනුව 2013 සැප්තැම්බර් 10 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී වාහන 06 ක් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ නොතිබූ අතර, එම අවස්ථාවේදී එම වාහන ධාවන කටයුතුවලද යොදවා නොතිබූ බව ද නිරීක්ෂණය විය.

(ඇ) බේරුම් නොකළ බැරකම්

දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් 31 දිනට වසර 01 ට අඩු බේරුම් නොකළ බැරකම් රු.6,422,206 ක් විය. මුළු බැරකම් වලින් රු. 2,482,175ක් විසර්ජන ගිණුමේ බැරකම් ලෙස දක්වා නොතිබුණි.

3.6 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසි යනාදියට අදාල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදි නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) අමාත්‍ය මණ්ඩල තීරණ | | |

| | | | |
|---|---|---|---|
| | 1991 දෙසැම්බර් 23 දිනැති අංක අමප/990/1981 දරන අමාත්‍ය මණ්ඩල තීරණය. | | කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන විවිධ දීමනා වෙනුවට සමස්ථ කාර්යයන් ආවරණය වනසේ නව දිරි දීමනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ආයතන අධ්‍යක්ෂ දන්වා තිබුණද, එසේ කටයුතු නොකර නිළධාරින්ට අවිධිමත් ආකාරයට නිෂ්පාදන තත්ත්වය නගා සිටුවීම සඳහා දීමනා ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| | (i) XXVIII පරිච්ඡේදයේ 1.1 වගන්තිය | | රජයේ නිලධාරින්ගේ රාජකාරි කළ යුතු සාමාන්‍ය කාර්යාල වේලාව සියළු වැඩ කරන දිනවල පෙ.ව. 8.30 සිට ප.ව 16.15 දක්වා වුවත් දෙපාර්තමේන්තුවේ වැඩ කරන දිනවල දිවා සේවා මුරය පෙ.ව. 8.30 සිට ප.ව. 15.45 හා රාත්‍රී සේවා මුරය ප.ව. 20.30 සිට පෙ.ව. 3.15 දක්වාත් බව නිරීක්ෂණය විය. |
| | (ii)VIII වැනි පරිච්ඡේදයේ 3.2 වගන්තිය | | අතිකාල දීමනා ගෙවිය හැක්කේ නිශ්චිත වශයෙන් නියම කරන ලද්දා වූ වැඩ සඳහා පමණක් වුවද ඊට පටහැනිව දෙපාර්තමේන්තුවේ නිළධාරීයෙකුට පැය 106 1/4 ක් සඳහා අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| | (iii) IX වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය | 319,300 | රහස් අංශයේ වහළය පිළිසකර කිරීම හා දෙපාර්තමේන්තු නවීකරණ කටයුතු අධීක්ෂණය, සුභසාධන, ගොඩනැගිලි, මැෂින් හා අනෙකුත් දීමනා වශයෙන් නිළධාරීන් තිදෙනෙකුට නිත්‍ය තනතුරේ වැටුපට අමතරව ආයතන අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය නොමැතිව ගෙවා තිබුණි. තවද අදාල තොරතුරු ගෙවීම් වවුචරයට අමුණා නොතිබුණු අතර ගණනය කිරීම් සම්බන්ධව පරීක්ෂාවකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ | | |

| | | | |
|---|---|---|---|
| | මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මුදල් රෙගුලාසි 110 | | හානි සම්බන්ධයෙන් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 371(5) | 1,458,291 | මිලදීගැනීමේදී භාණ්ඩ ගබඩාවට ලබා නොගෙන එම භාණ්ඩ සඳහා මිල ගණන් ඉදිරිපත් කරන අවස්ථාවේදීම ගෙවීම් කර තිබුණි. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| | 2012 මාර්තු 26 දිනැති අංක 07/2012 දරන චක්‍රලේඛයේ 03 ඡේදය හා 1997 පෙබරවාරි 03 දිනැති අංක 8/97 දරන චක්‍රලේඛය | 782,100 | (i)අතිකාල දීමනා හිමි නිලධාරින්ට විශේෂ දීමනා එනම් සංයුක්ත දීමනාවට සමානවූ අමතර දීමනාවක් හිමි නොවන නමුත් දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සහභාගි වූ දෙපාර්තමේන්තුවේ නිලධාරින් හට අතිකාල දීමනා ගෙවීම්වලට අමතරව විශේෂ දීමනාවක් ගෙවා තිබුණි.<br>(ii) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය මත අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය නොමැතිව දීර්ඝකාලීනව උපරිම සීමාව ඉක්මවා අතිකාල දීමනා ගෙවා තිබුණි.<br>(iii) මසකට පැය 20 කට වඩා අතිකාල සේවයේ යෙදෙන නිළධාරීන්ගේ ලැයිස්තුවක් දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශයට ඉදිරිපත් කර නොතිබුණි.<br>(iv) අතිකාල රාජකාරි සම්බන්ධයෙන් තමන් කරන ලද නිර්දේශයන් සෑම මාස 03 කට වරක්ම දෙපාර්තමේන්තු ප්‍රධානියා සමාලෝචනය කර නොතිබුණි. |

(v) මූල්‍ය ගනුදෙනුවල නිසි පිරිමැසුම්භාවයෙන් ක්‍රියා කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ප්‍රායෝගික නොවන පරිදි, සේවයේ යොදවා තිබුණි. උදා: එක් මාසයක නියැදි පරීක්ෂාවකදී නිලධාරියෙක් පැය 35 සිට පැය 86 දක්වා වන ලෙස නිලධාරීන් 5 දෙනෙකු අඛණ්ඩව රාජකාරි කටයුතුවල යොදවා තිබුණි.

(ඉ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | |
|---|---|
| 2008 ජුනි 24 දිනැති අංක 929,482 පීඑෆ්/06/07/02/01 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය | මුද්‍රණ කාර්යයන් වෙනුවෙන් පුද්ගලික ආයතන හා පුද්ගලයන් 10 දෙනෙකුගෙන් ලැබිය යුතු හිග ආදායම් වර්ෂ 03 කට අධික කාලයක සිට අයකරගෙන නොතිබුණි. |

(ඊ) ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ චක්‍රලේඛ

| | |
|---|---|
| 1991 දෙසැම්බර් 23 දිනැති අංක PPI/MP/FC/18 දරන ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරිමේ අමාත්‍යාංශයේ ලිපිය | පාර්ලිමේන්තු සම්බන්ධීකරණ නිලධාරී තනතුරට මෝටර් සයිකල් සඳහා ඉන්ධන ලීටර් 40ක් පමණක් අනුමත කර තිබුණද නිවසට යෑම සඳහා ප්‍රවාහන පහසුකම් ලබා ගෙන තිබුණි. |

3.7 කාර්ය සාධනය

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලසුම්වලට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකල ප්‍රධාන කාර්යයන්

(i) මුද්‍රණ කාර්ය කාර්යක්ෂමතාවය වැඩි කර ගැනිමට ඉවහල් වන මුද්‍රණ සේවක පුහුණු හා වර්ධනය සඳහා 2012 වර්ෂයේ ප්‍රතිපාදිත මුදලින් සියයට 77 ක් හෙවත් රු.308,000 ක් උපයෝජනය කර නොතිබුණි .

(ii) නියමිත දිනට පාසල් පොත් මුද්‍රණය කර භාරදීමට නොහැකිවීමත්, නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවීමත් මත, දිගින් දිගටම දඩ මුදල් හා ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවී ඇති අතර, 2010 හා 2011 වර්ෂවලදී ඒ සඳහා රු. 1,292,689 ක්

හා රු. 3,662,309 ක් ගෙවා තිබුණි. තවද, 2012 වර්ෂයේ සමස්ථ පාසල් පොත් ඇණවුමෙන් සියයට 1.25 ක් වූ අඩු ඇණවුම් ප්‍රමාණයක් වාර්ෂිකව ලැබී තිබියදීත් ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට පාසල් පොත් මුද්‍රණය කර භාරදීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) සැලසුම් කිරීම

වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට අත්‍යවශ්‍ය පැලැට් ට්‍රක් (Pallet Truck) යන්ත්‍රයක් මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වැය විෂයන් යටතේ සළසා තිබුණි. එම වැය විෂය යටතේ සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 75 ක් ගෙවා රු.85,755,103 ක ප්‍රතිපාදන වර්ෂය අවසාන වන විට ඉතිරිව පැවැතියත් එම යන්ත්‍රය මිලදී ගෙන නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 128 (1) (අ) පරිදි අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය පිළිබඳ සැලකිල්ලක් නොදක්වා ෆර්පොරේටින් කෝම්බ් යන්ත්‍රය ඇස්තමේන්තු වටිනාකම සියයට 200 ක් හෙවත් රු 4,500,000ක් ඉක්මවූ වටිනාකමකට මිලදී ගෙන තිබුණි.

3.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

ගැලපුම් කළ යුතු ශේෂ

කාල විශ්ලේෂණය

| | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 1 ට වැඩි වර්ෂ 03 ට අඩු | වර්ෂ 3 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| (i) උපලබ්ධි නොවූ තැන්පතු | - | - | 14,944 | 14,944 |
| (ii) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 13,158 | 15,156 | 1,072,783 | 1,101,097 |
| (iii) හඳුනා නොගත් හර | - | 18,950 | 262,162 | 281,112 |
| (iv) හඳුනා නොගත් බැර | - | 15,385 | 400 | 15,785 |

මුදල් පොතට ඇතුළත් වී නොමැති රු. 548,888 ක සාවද්‍ය ලැබීම්, උපලබ්ධි නොවූ ලැබීම් ලෙස බැංකු සැසඳුමෙහි ඇතුළත් කර තිබුණි.

3.9 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

2012 වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව රු. 2,214,358 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කිරීමකින් තොරව අදාල වියදම් කර තිබුණි.

(ආ) ප්‍රදර්ශන කුටිය සැකසීම, අලංකාර කිරීම හා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු.836,563ක් වැයකර තිබුණද, අවශ්‍ය ද්‍රව්‍ය හා ඒවායේ ප්‍රමාණය ඇස්තමේන්තු කර නොතිබීම හේතුවෙන් අවම පිරිවැයක් යටතේ වඩාත් ඵලදායි තෝරා ගැනීමක් කළහැකි වන පරිදි මිල කැඳවීම් කර නොතිබුණි.

(ඇ) ප්‍රවාහන හා සංග්‍රහ වියදම් ලෙස ප්‍රතිපූර්ණය කරන ලද රු. 19,100 ක් සඳහා බිල්පත් හෝ අදාල සේවකයන් මුදල් ලබාගත් බවට සාක්ෂි, අමුණා නොතිබුණි.

3.10 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තු විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ භෝජනාගාරය සඳහා රු.591,304 ක් වටිනා උපකරණ මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.7.1 මාර්ගෝපදේශය ප්‍රකාර අවම ලංසුව බැහැර කර මිලදී ගැනීම හේතුවෙන් රු.62,101 ක අතිරේක වියදමක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි.

3.11 කළමනාකරණ දුර්වලතා

(අ) දෙපාර්තමේන්තුවේ පිවිසුම් දොරටුව ඉදිකිරීම

දෙපාර්තමේන්තුවේ පිවිසුම් දොරටුව ඉදිකිරීම සඳහා රු.1,620,748 ක වියදමක් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

පෞද්ගලික ඉදිකිරීම්කරුවෙකු පිවිසුම් දොරටුව ඉදිකිරීම සඳහා රු.900,000 කට එකඟ වී තිබුණත් දෙපාර්තමේන්තුව විසින් එම කාර්ය රු.1,620,748 ක් වැය කර නිම කිරීම නිසා රු.720,748 ක් වැඩිපුර වැය කිරීමට සිදුවී තිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තුව තුළ ඉදිකිරීම් පිළිබඳව අධීක්ෂණය කිරීමට සුදුසුකම්ලත් නිලධාරියෙකු නොමැති වීම හේතුවෙන් අදාළ ඉදිකිරීම, ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනයේ (ICTAD) මාර්ගෝපදේශවලට පටහැනිව ඉටුකර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි නඩත්තු හා ඉදිකිරීම්

2011 හා 2012 වර්ෂයන්හිදි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි නඩත්තු හා ඉදිකිරීම් සඳහා රු.25,436,419 ක් වැය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.7 මාර්ගෝපදේශයට පටහැනිව කටයුතු කර තිබුණි.

(ii) නඩත්තු හා ඉදිකිරීම් සම්බන්ධයෙන් වැඩ පත්‍රිකා සකස් කර නොතිබූ අතර එක් එක් වැඩය සම්බන්ධයෙන් සකස් කර තිබූ දළ ඇස්තමේන්තු සම්මත ගොඩනැගිලි රේටයන් පදනම් කරගෙන නොතිබුණි.

(iii) නඩත්තු හා ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් ප්‍රසම්පාදනය කර ඉතිරිවන බඩු පිළිබඳව විස්තර නොතිබුණු අතර, එම බඩු අනුමැතියකින් තොරව වෙනත් කාර්යයන් සඳහා යොදාගෙන තිබුණි.

(iv) අනුමත දළ ඇස්තමේන්තු ඉක්මවා නඩත්තු හා ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණද අතිරේක වැඩ වෙනුවෙන් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(v) ගොඩනැගිලි ඇස්තමේන්තු සකස් කිරීම හා ඉදිකිරීම් නඩත්තුව සඳහා එම විෂය පිළිබඳ සුදුසුකම් ලත් තාක්ෂණ නිලධාරීන් දෙපාර්තමේන්තුවේ නොමැති විය.

3.13 මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 36 | 16 | 20 |
| (ii) තෘතියික මට්ටම | 08 | 03 | 05 |
| (iii) ද්විතියික මට්ටම | 1221 | 772 | 449 |
| (iv) ප්‍රාථමික මට්ටම | 674 | 505 | 169 |
| එකතුව | 1939 | 1296 | 643 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 643 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූල නොවීම

2012 මැයි 17 දිනැති අංක ඩීඑම්එස්/සී/08/45 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව පාර්ලිමේන්තු සම්බන්ධීකරණ නිළධාරී තනතුර අනුමත කර නොතිබුණි.